
# කූඹිච්චිගේ අපූරු නුවණ



ඩී.පී. අනුභා සතිකා දවටගොල්ල

# කුඹිච්චිගේ අපූරු නුවණ

ඩී.ජී. අනුහා සතිකා දවටගොල්ල
කතෘ

පළමු දිගහැරීම

මහනුවර මහාමායා බාලිකා විදුහල
4 වසර
කෘතිය පළ කරන දිනය
2025.02.08

ISBN 978-624-208-553-1

# පිදුම

මගේ පුංචි ජයග්‍රහනයකදී පවා
මටත් වඩා ගොඩාක් සතුටු වෙන
මගේ ආදරණීය තාත්තාට, මගේ
අම්මාට, අත්තම්මාට, මගේ එකම පුංචි
නංගිට
මම ලැබූ තවත් ජයග්‍රහනයක් වූ
මේ පොත ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **''හෙරණගත්කරණී''** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කූඹිච්චිගේ අපූරු නුවණ

ඔන්න එකමත් එක කැලයක ලොකු සියඹලා ගසක් තිබුණා. මේ සියඹලා ගස යට තිබුණු කූඹි ගුලක කූඹියන් රැළක් ජීවත් වුණා. මේ අය හරිම එකමුතුයි. එකිනෙකාට උදවු කරගනිමින් සතුටින් හිටියා. දවසක් කූඹියන් ගුල ඇතුළේ කසු කුසු ගාමින් මොනවදෝ කතා කරනවා නායකතුමාට ඇසුණා. "මොනවද ඔබලා ඔය කතා කරන්නේ?" කියලා නායකතුමා ඇසුවා.


"නායකතුමනි, කැළේ පුරා නපුරු තලගොයෙක් ඉන්නවා කියලා නුග ගහ යට ගුලේ අය කිවුවා. එයාලගේ කීප දෙනක්ම කෑම සොයන්න ගිහින් නැවත ආවේ නෑ කියන්නේ. එහෙමද ? එහෙනම් අපට නපුරු කාලයක් උදා වෙලා වගේ. අපේ ආරක්ෂාව දැඩි කරන්න ඕන. අපේ පුංචි දරුවන් රැකගන්න ඕන. සියලු දෙනාව ම දැනුවත් කරන්න." නායකතුමා උපදෙස් දුන්නා.



ඉදිරියේදී වැහි කාලය පැමිණෙන නිසා කූඹියන් කෑම රැස් කරන්න පටන් ගත්තා. කූඹියන් කූඹිච්චියන් කඩිමුඩියේ කෑම සොයන්න වෙහෙසුණා. සමහර කූඹි දරුවන් දෙමාපියන් සමඟ කෑම සොයන්න යන්න සූදානම් වුණා. "අනේ පුතේ අපි ගොඩාක් ඈතට යනවා. ඔයාලගේ කකුල් රිදෙයි. තව ටිකක් ලොකු වුණාම යමුකෝ"කූඹි අම්මලා කිවුවා.

කූඹි පැටියන් ගුලට වී සෙල්ලම් කළා. එළියෙන් අමුතු සද්දයක් ආව නිසා, එක් කූඹි පැටියෙන් එළියට ඇවිත් බැලුවා. එදා මේ කූඹි ගුලට ඉතා අයහපත් දවසක් උදා වුණා. කැලයේ ඒ මේ අත ඇවිදමින් කෑම සොයාගෙන යන තලගොයා මේ ගුලට ළඟට ආවා.

තලගොයාගේ දිග දිව දික් කරමින් පුංචි කූඹි පැටියාව ගිලලා දැම්මා. කෑම සොයාගෙන ගුලට ආපු කූඹියන්ට සිද්ධ වුණ සියල්ල පැටව් කිවුවා. පැටියාගේ අම්මා ඉකිගසමින් ඇඬුවා. කවදාවත් මෙවැනි දෙයක් සිදු නොවුණු නිසා සිදුවුණ දේ ගැන කූඹි නායකයා ගොඩාක් දුක් වුණා.



"දැන් අපට අපේ කූඹි පැටියා බේරාගන්න ක්‍රමයක් නැහැ." නායකතුමා පැටියාගේ මව සනසමින් කිවුවා. "මින් ඉදිරියට මෙවන් දෙයක් නොවෙන්ට අපි වගබලා ගනිමු. මම මගේ රැළේ කිසිම දරුවෙකුට කිසිම කරදරයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ. අපි එකතු වෙලා මේ කරදරයෙන් බේරෙන්න ක්‍රමයක් කල්පනා කරමු. විසඳුමක් ලැබෙන තුරු ගුල අසල මුරකාවල් යොදවන්න."නායකතුමා අණ කළා.

මේ රැළේ සිටියා නුවණැති පුංචි කූඹිච්චියක්. දිනක් මේ කූඹිච්චි නායකතුමා මුණගැසී සතරකන් මන්ත්‍රනයක් පැවැත්වුවා. කූඹිච්චි පැවසූ දෙය අසා නායකතුමා බොහෝ සතුටට පත් වුණා. අගේ ඇති නුවණ කියමින් නායකතුමා කූඹිච්චිට ප්‍රසංශා කළා. සියලු කූඹියන් ගෙන්වා කළ යුතු සියල්ල පැහැදිලි කර දුන්නා. මෙවර සතුරාව පරද්දවන්න සියල්ලෝ ම සූදානම් වුණා.

දිනක් සතුරා පැමිණියා. ගුල අසල මුර සේවයේ යොදවා තිබූ කූඹියා සතුරා පැමිණි බව දැන්වුවා.



මෙවර නම් කූඹියන් බය වුණේ නැහැ. නායකතුමා එඩිතරව ඉදිරියට ගියා. නමුත් මෙවර තලගොයා ද සටනට සූදානමින් පැමිණ සිටි නිසා සටන ලේසි වුණේ නැහැ. සටන අතරතුර නායකතුමාට තුවාල සිදුවුණා. කූඹියන් එකතු වී නායකතුමා සටන් බිමෙන් ඉවත් කර, කූඹිච්චි සහ අනෙක් කූඹියන් සටනට ගියා. කූඹිච්චිගේ අදහස ක්‍රියාත්මක වුණා. තලගොයා සමඟ සටන යන අතර තුර පුංචි කුහුඹු පැටියන් කොළ රොඩු අස්සේන රිංගා ගොස් තලගොයාගේ බඩයට කිති කැවුවා. සමහර කූඹි පැටියන් තලගොයාගේ බඩ, වලිගය හැපුවා. තලගොයා දඟලන්නට පටන් ගත්තා. “අනේ මට කිති. හි ........හි...... අම්මෝ........ රිදෙනවා. මාව හපන්න එපෝ.......... අනේ මම ආයෙ නම් මෙහෙ එන්නේ නෑ. මාව අතහරින්න.” කියලා තලගොයා අඬන්න ගත්තා. කූඹි රැළේ සියලු දෙනාම හයියෙන් හිනා වුණා .



අපි දිනුවා අපි දිනුවා
එකතු වෙලා අපි දිනුවා
තලගොයාව පැරැද්දුවා
කූඹිච්චිට ජය වේවා

කූඹියන් ජය ඝෝෂා පැවැත්වුවා. කූඹිච්චිව වට කරගෙන කූඹියන් සියල්ලන්ම නැටුවා.

එදා සිට තලගොයා මේ කැලයේ නොසිට යන්න ගියා. කූඹිච්චිගේ මේ අපූරු අදහස නිසා කැලයේ සිටි කූඹියන්ට පමණක් නොව, අනෙකුත් පුංචි සතුන්ටත් කිසිම බයක් නැතිව ඉන්න පුළුවන් වුණා. මේ සතුට සමරන්න කූඹි නායකයා කැලයේ සිටි පුංචි සතුන් සියල්ලන්ට ම ආරාධනා කළා.

තලගොයා සමඟ සටනේදි කැඩී බිඳී ගිය තැන් කූඹියන් විසින් නැවත සෑදුවා. කූඹිච්චියන් ගුල ඇතුළ ලස්සනට සැරසුවා. කූඹි පැටවුන්ට නම් සතුට පිරුණු දවසක් වුණා. සමහර කූඹි දරුවන් වැඩිහිටි කූඹින් කරන වැඩ වලට උදවු උපකාර කළා. එදා රාත්‍රියේ කූඹි ගුලේ සාදය පැවැත්වුවා. විදුලිය ලබා දුන්නා. කණාමැදිරියන්,රැබදුල්ලන්,රැහැයින් සහ තණකොළපෙත්තන් සාදයට පැමිණියා. එදා රෑ කණාමැදිරියන් සහ රැබදුල්ලන් කූඹි ගුල ආලෝකමත් කරන්න නොමිලේ ම විදුලිය ලබා දුන්නා.

රැහැයින් සහ තණකොළපෙත්තන් සංගීතයෙන් එදා සාදය වර්ණවත් කළා. රැහැයින්ගේ නාදය ටිකක් විතර අසා සිටින්න අපහසු වුවත්, සියල්ලන්ගේම සිනා හඬින් ඒ අපහසුතාවය කාටමවත් ම දැණුනේ නැහැ. එදා රූ කූඹී ගෙදර දිව්‍ය ලෝකයක අසිරිය මැවුවා.

වෙන්න ගිය ලොකු කරදරයක් කූඹිච්චිවගේ අපූරු නුවණ නිසා නතර කර ගන්න පුළුවන් වුණා. ඒ ගැන හිතනකකොට කූඹිච්චිට එයා ගැන පුංචි ආඩම්බරයකුත් ඇති වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රමුඛතම මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්